



# කවකටුවෙන් රවුම් වෙලා

උසස් පෙළ විභාගයට පෙනී ඉඳලා ප්‍රතිඵල බලන්න ආව පාසල් සිසුවියන් දෙන්නෙක්. ඔවුන් හොඳ මිතුරියෝ. විභාගයෙන් දෙන්නම අසමත්......!

''මොකක්ද වුණේ.....?''

මේ දෙන්නාට තමන්ගේ පන්ති කාමරයේ අතීතය සිහිවෙනවා. දෙන්නා වාඩි වෙලා හිටියේ පන්තියේ අන්තිම පේළියේ, එක ළඟ. ගුරුවරුන් පාඩම් උගන්වන අතරේ මේ දෙන්නා කළේ මොනවද? එක්කෙනෙක් සටහන් ලියනවා වෙනුවට කොපි පෙත්වල කවි ලියපු එකයි කළේ. අනික් යාළුවා ඩෙස් බංකු උඩ චිත්‍ර ඇඳපු එකයි කළේ. ඉතින් කොහොමද විබාග සමත් වෙන්නේ? මකන්න පහසුවට කවි ලියන යෙහෙළිය ඒවා ලිව්වේ පැන්සලෙන්. චිත්‍ර අඳින යෙහෙළිය කවකටුවෙන් රටා අඳින එකයි කළේ. මේ කවකටුවයි, ඒකට අමුනපු පැන්සලයි, පන්තියේ එකට ම උන්න යෙහෙළියෝ දෙන්නාට මේ ගී පද රචනාවේ යොදා ගැනෙන්නේ උපමා විදියට.

මේ දෙන්නාගේම හිත ගිය පිරිමි ළමයෙකුත් පන්තියේ හිටියා. මේ පිරිමි ළමයා වාඩිවෙලා හිටියේ පන්තියේ පළවෙනි පේළියේ. ඉගෙන ගන්න දක්ෂ, උනන්දු මේ පිරිමි ළමයා පළවෙනි පේළියේම වාඩි වෙලා තමන්ගේ පාඩුවේ ඉගෙනගන්න වැඩ කරගෙන ගියත්, මේ දඟකාර යෙහෙළියන් තමන් ගැන උනන්දුයි කියල දන්නේවත් නෑ. චිත්‍ර අඳින යෙහෙළියට කවකටුව අතට අහුවුණාම ඇඳුනේම මේ පිරිම ළමයාගේ රවුම් මූණ. කවි සින්දු ලියන යෙහෙළියට තමන් කුරුටු ගාමින් ලියන දේවල්වලට නිමිත්ත වුණේ ම මේ පිරිමි ළමයා.

පන්තියේ පළවෙනි පේළියේ ම වාඩි වෙලා ඉගෙන ගත්ත මේ පිරිමි ළමයා හැමදාම පන්තියේ පළවෙනියාත් වුණා.

යෙහෙළියෝ දෙන්නාගෙම හිතේ මේ පිරිමි ළමයා ගැන උනන්දුවක් . ඒත් අද කෝ මේ ළමයා....?

ගණන් හදන්න දක්ෂ මේ පිරිමි ළමයා ඉළක්කම් වලින් ම දක්ෂකම් පෙන්නලා විභාගයෙන් ඉහළින්ම සමත් වෙලා, විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයට තේරිලා. පිරිමි ළමයා කලින් ම ඇවිත් ප්‍රතිඵල බලාගෙන ආපහු යන්නත් ගිහින් පළවෙනියෙන්ම.

හැමදාමත් පන්තියේ අන්තිමයෝ වෙවී උන්න යෙහෙළියෝ දෙන්නා ප්‍රතිඵල බලන්න එන්නේත් අන්තිමට. විභාගය අසමත් බව දැනගෙන මේ යෙහෙළියෝ යන්නේ පන්තියේ තමන් වාඩි වෙලා හිටපු ඩෙස් බංකු දිහාවට. ඉගෙන ගන්න තිබුණ කාලේ ඩෙස් බංකුවේ ඇන්ද රූප වගේ ම කොපි පොත්වල ලියපු කවි සින්දු දැන් මෙයාලා දෙන්නට හිනා වෙන්නේ සමච්චලයෙන්.

මාගේ දියණිය, සරිනි වෙනුවෙන් පද රචනා කළේ ඒ ඒ කාලයට ගැලපෙන්න. මේ රචනාව කරනා කාලය වෙන විට ඇය විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටියා විතරයි. ඇය ප්‍රිය කළ ගායන ශිල්පිණියක් නිරෝෂා විරාජිනී ප්‍රවීණ ශිලපිණිය. ඇය ගැයූ 'දුහුලු මලක' ගීය සරිනි වඩාත් කැමති ගීයක්. ඒ ගීයේ සංගීත නිර්මාණය කළ මහින්ද බණ්ඩාර ප්‍රවීණ ගිටාර් වාද්‍ය ශිල්පියාණන්ට මයි මගේ පද රචනාවේ තනු නිර්මාණයට භාර දුන්නේ. පද රචනාව කියවන අතරේ ම මහින්ද බණ්ඩාර ශිල්පියාණන්ගේ මුව'ගට නැගුණ සිනහවෙන් මට දැනුණේ එය ඔහු ක්ෂණයෙන් වටහා ගත් බව. මා මැවීමට උත්සාහ කළ හාස්‍ය රසය බණ්ඩාරයන්ගේ තනුවෙන් හොඳින් ඉස්මතු වෙන්න හේතුව මේ නිසි අවබෝධයයි. ඒ අතරේ දුක්බර බවකුත් කැටි වෙලා වගෙයි. ගීයේ යුග ගැයුමට මා යෝජනා කළේත් නිරෝෂා විරාජිනිය ම යි. නිරෝෂා විරාජිනිය වාගේ අති ප්‍රවීන ශිල්පිනයක සමඟ නවක ගායිකාවක ලෙස සරිනිට ගායනා කරන්නට සැළැස්වීමෙන් දෙදෙනා අතර ගායනයේ වෙනස්කම් ඉස්මතු වේ යැයි සිතුණ බව ඇත්ත. එසේ වුණත් ඒ වෙනස අවම වෙන තරමින් ගයන්නට සරිනිට හැකි වුණා. නිරෝෂා විරාජිණියගේ තීව්‍ර මිහිරි ලයාන්විත ගායනය සමඟ සරිනි දිසානායක නව යොවුන් දියණියගේ හඬ මුසු වුණ මේ ගීයට ඔවුන් හඬ මුසු කළේ එකට. එකම වතාවක. දයානන්ද පෙරේරා ප්‍රවීණ ශබ්ද පටිගත කිරීමේ ශිල්පියාණන් මේ ගීය මහින්ද බණ්ඩාරයන්ගේ අවශ්‍යතා අනුව පටිගත කරගත්තේ ඉතා කෙටි කාලයක දී.



සිසිර දිසානායක

*පළවෙනි යෙහෙළිය:*
කවකටුවෙන් රවුම් වෙලා
ඇඳුනේ යස රවුම් මූණ

*දෙවන යෙහෙළිය:*
පැන්සලයෙන් අකුරු වෙලා
ඉනුවේ රස කුරුටු ගීය

*දෙදෙනා:*
කවකටුවයි, පැන්සලයයි
වගේ උන්න අපි කොහේද දැන්?

*පළවෙනි යෙහෙළිය:*
පන්තියෙ පළවෙනි පේළියෙ
යස පෙණුමට උන්න රූපෙ

*දෙවෙනි යෙහෙළිය:*
කවි සිතුවිලි මැව්ව රූපෙ
ඉළක්කමෙන් ඉගිල්ලිලා
කොහේ ගියාදෝ?

*දෙදෙනා:*
පන්තියෙ පළවෙනි පේළියේ
පළවෙනියා කොහේ ගියාදෝ...?

*දෙවෙනි යෙහෙළිය:*
පන්තියෙ අන්තිම පේළියෙ
කොපි පොත්වල ලිව්ව ගීත

*පළවෙනි යෙහෙළිය:*
ඩෙස් බංකුවෙ ඇන්ද රූප
සමච්චලෙන් හිනා වෙවී
බලා ඉන්නවෝ.

*දෙදෙනා:*
පන්තියෙ අන්තිම පේළියෙ
අන්තිමයෝ වුනේ කෝම දෝ.....?

*ගායනය:* **නිරෝෂා විරාජිනී සමග සරිනි දිසානායක**
*සංගීතය:* **මහින්ද බණ්ඩාර**
*රචනය:* **සිසිර දිසානායක**